WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

40 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| සංගීතය (පෙරදිග) | I, II | පැය තුනයි |
| சங்கீதம் (கீழைத்தேய) | I, II | மூன்று மணித்தியாலம் |
| Music (Oriental) | I, II | Three hours |

## සංගීතය (පෙරදිග) I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සධපධ, මපගම, ගරිස යන ස්වර ඛණ්ඩය භෛරවී රාගයට අදාළ ස්වර ඛණ්ඩයක් වීම සඳහා කෝමල විය යුත්තේ,
(1) රිෂභයයි. (2) රිෂභය හා ගාන්ධාරයයි.
(3) රිෂභය, ගාන්ධාරය හා ධෛවතයයි. (4) රිෂභය, ගාන්ධාරය, ධෛවතය හා නිෂාදයයි.

**2.** සංගීත විෂය හදාරන ආධුනිකයකු ආරම්භයේ දී ම පුහුණු විය යුතු සංගීතාංගයක් තෝරන්න.
(1) ඛ්‍යාල් ගීත (2) රාග ආලාප (3) තානාලංකාර (4) ස්වර අභ්‍යාස

**3.** සධ̣සරිගරිස, සධ̣සරිගපගරිස යනුවෙන් විස්තාර වන ස්වර අභ්‍යාසය කිසියම් රාගයකට අනුව නිර්මාණය වී ඇත. එම රාගය තෝරන්න.
(1) බිලාවල් (2) භූපාලි (3) කාෆි (4) යමන්

**4.** කිසියම් රාගයක රාග විස්තර ඇතුළත් කරමින් ප්‍රබන්ධ වූ ගීත විශේෂය හඳුන්වනු ලබන්නේ,
(1) සර්ගම් නමිනි. (2) මධ්‍යලය ගීත නමිනි.
(3) ස්වර ස්ථාපන ගීත නමිනි. (4) ලක්ෂණ ගීත නමිනි.

**5.** බෙම්ටෝ සහ ජප් තාල දෙකේ මාත්‍රා සංඛ්‍යාවන් එකතු වූ විට ලැබෙන මාත්‍රා සංඛ්‍යාවට සමාන මාත්‍රා සංඛ්‍යාවකින් යුත් තාලය තෝරන්න.
(1) කෙහෙර්වා (2) දීප්චන්දි (3) දාදරා (4) ත්‍රිතාල්

WWW.OLEVELAPI.COM

**6.** ගපධනිසි, මගමරිස යන ස්වර සංගති අයත්වන රාගය
(1) බිලාවල් ය. (2) කාෆි ය. (3) භූපාලි ය. (4) භෛරවී ය.

**7.** ඖඩව, ෂාඩව, සම්පූර්ණ යන රාග ජාති ස්වර සංඛ්‍යා මගින් දැක්වෙන්නේ පිළිවෙලින්
(1) 5, 6, 7 වශයෙනි. (2) 6, 5, 7 වශයෙනි. (3) 7, 6, 5 වශයෙනි. (4) 6, 7, 5 වශයෙනි.

**8.** යමන් සහ භූපාලි යන රාග යුගලය අයත් වන මේලය නම් කරන්න.
(1) භෛරවී (2) බිලාවල් (3) කල්‍යාණ (4) කාෆි



**9.** භෛරවී රාගයට අදාළ **නො වන** කරුණ තෝරන්න.
(1) සම්පූර්ණ ජාතියට අයත් රාගයක් වේ.
(2) වාදි ස්වරය ෂඩ්ජය වන අතර සංවාදි ස්වරය මධ්‍යමය වේ.
(3) ප්‍රකෘති විකෘති ස්වර දොළොසම වුව ද භාවිත කළ හැකි ය.
(4) දිවා ප්‍රථම ප්‍රහරය තුළ ගායනය කෙරේ.

[දෙවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**10.** සස රිරි ගුගු මම | ප- පම ගුරි ස | වශයෙන් යෙදෙන තානාලංකාරය අයත් වන රාගය නම් කරන්න.
(1) භෛරවී (2) භූපාලි (3) යමන් (4) කාෆි

● අංක **11** සිට **15** තෙක් ඇති ප්‍රශ්නවලට පහත සඳහන් රූප සටහන ඇසුරින් පිළිතුරු දෙන්න.

A

B

C

D


**11.** විශාරද බී. වික්ටර් පෙරේරා (ශ්‍රී ලාංකේය) පණ්ඩිත් වී. ජී. ජෝග් (උත්තර භාරතීය) යන සංගීතඥයින් දෙදෙනා ප්‍රවීණත්වය දැරූ සංගීත භාණ්ඩය සඳහන් අක්ෂරය තෝරන්න.
(1) **A** (2) **B** (3) **C** (4) **D**

**12.** '**B**' හි දැක්වෙන භාණ්ඩයෙහි සියලුම සිදුරු විවෘත කළ විට හා වැසූ විට ලැබෙන ස්වර දෙක වන්නේ පිළිවෙලින්,
(1) පංචමය හා තීව්‍ර මධ්‍යමයයි.
(2) ෂඩ්ජය හා පංචමයයි.
(3) තීව්‍ර මධ්‍යමය හා පංචමයයි.
(4) ශුද්ධ මධ්‍යමය හා පංචමයයි.

**13.** '**C**' හි දැක්වෙන භාණ්ඩය වැයීම සඳහා විශිෂ්ටත්වයක් උසුලන ප්‍රකට වාදකයෙකි,
(1) පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා.
(2) අසීස් චන්ද්‍ර බෙනර්ජී.
(3) උස්තාද් අල්ලා රක්ඛා.
(4) පණ්ඩිත් රවි ශංකර්.

**14.** අළුවෙන් වයන භාණ්ඩ දැක්වෙන ඉංග්‍රීසි අක්ෂර දෙක වනුයේ,
(1) **A** සහ **B** ය. (2) **B** සහ **C** ය. (3) **A** සහ **D** ය. (4) **C** සහ **D** ය.

**15.** දිල්රුබාව හා බෙහෙවින් ම සමාන වන භාණ්ඩය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න.
(1) **A** (2) **B** (3) **C** (4) **D**

**16.** විකෘති ස්වර දෙකක් යෙදෙන නිර්දේශිත සම්පූර්ණ ජාති රාගයක් නම් කරන්න.
(1) භෛරවී (2) කාෆි (3) භූපාලි (4) යමන්

**17.** ධාධිංධිංධා | ධාධිංධිංධා | ධාතිංතිංතා | - - - -
මෙම ඨේකාවේ සිවුවන විභාගයට ඇතුළත් වන අවනද්ධාක්ෂර තෝරන්න.
(1) ධාතිංතිංතා (2) තාධිංධිංධා (3) ධාධිංධිංධා (4) තාධාධිංධා

**18.** යමන් රාගයට අදාළ වන නිවැරදි තොරතුර තෝරන්න.
(1) උත්තරාංගවාදී රාගයකි.
(2) දිවා ප්‍රථම ප්‍රහරය තුළ ගැයේ.
(3) කල්‍යාණ මේලයෙන් උපදී.
(4) වාදී, සංවාදී ස්වර ධ සහ ග වේ.

WWW.OLEVELAPI.COM

**19.** සසරිරි | ගුගුමම | ප- - - | මෙම ස්වර පාදය මධ්‍යම භාවයෙන් ලියූ විට ලැබෙන ස්වර පාදය,
(1) මමපප | ධධනිනි | සං- - - | වේ.
(2) ම́ම́පප | ධධනිනි | සං- - - | වේ.
(3) මමපප | ධ̲ධ̲නි̲නි̲ | සං- - - | වේ.
(4) මමපප | ධධනි̲නි̲ | සං- - - | වේ.

**20.** | ධ̽ගෙනති | තූකධින | වශයෙන් යෙදෙන තබ්ලා පදය වැයීමට සුදුසු ගී පාදය තෝරන්න.
(1) වඳිමු සුගත ශාක්‍ය සිංහ
(2) සුවඳ පද්ම ඕලු ආදී
(3) මිහිකත නළවාලා
(4) සසර වසන තුරු

● අංක **21** සිට **23** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ජන ගී පාද උපයෝගි කරගන්න.
A - සඳවා සුදු වැලි පිට්තුරු
B - මන මත් කරවන දන මුළු දෙරණා
C - රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා

**21.** ඉහත දැක්වෙනුයේ,
(1) ප්‍රශස්ති ගී පාද තුනකි.
(2) හටන් ගී පාද තුනකි.
(3) සැලළිහිණි සංදේශයේ එන ගී පාද තුනකි.
(4) ගුත්තිල කාව්‍යයේ එන ගී පාද තුනකි.

[තුන්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

22. 'B' හි ඇතුළත් 'මනමත් කරවන දන මුළු දෙරණා' ගී පාදය අයත්වන පැදි වර්ගය නම් කරන්න.
(1) දොළොස්මත් පැදි (2) අට විසිමත් පැදි
(3) සොළොස්මත් පැදි (4) දස අටමත් පැදි

23. 'C' හි දැක්වෙන ගී පාදයට උචිත තිත නම් කරන්න.
(1) මැදුම් තනි තිත (2) මැදුම් මහ දෙතිත
(3) සුළු මහ දෙතිත (4) මහ තනි තිත

24. වෙස්සන්තර කාව්‍යයේ එන වැළපුම් ගී නාද රටා අනුසාරයෙන් නිර්මාණය වූ සරල ගීතයකි,
(1) දුනුකෙයියා මලක් වගේ. (2) ගමට කලින් හිරු.
(3) කඳුළු හෙලා නෑඹිලියට. (4) මිහිමඬලේ අඳුරු කුසේ.

- අංක 25 සිට 28 තෙක් ප්‍රශ්නවලට වගුවේ ඇති තොරතුරු ආශ්‍රය කර ගනිමින් පිළිතුරු සපයන්න.

| A | B |
|---|---|
| • නාමිකව වන්නම් 24ක් වුවත් භාවිතයේ යෙදෙන්නේ වන්නම් 18කි. | • බෙරපදය, තානම, කවිය, ඉරට්ටිය වශයෙන් යෙදේ. |
| • දවුල වාදනයට යොදා ගැනේ. | • වෘත්තයක් හා තාලයක් පදනම් කරගෙන නිර්මාණය වී ඇත. |

25. ඉහත වගුවේ 'A' සහ 'B' යටතේ ඇතුළත් වන්නේ පිළිවෙලින්
(1) උඩරට වන්නම් හා පහතරට සින්දු වන්නම්වලට අදාළ තොරතුරු වේ.
(2) පහතරට සින්දු වන්නම් හා උඩරට වන්නම්වලට අදාළ තොරතුරු වේ.
(3) සබරගමු වන්නම් හා පහතරට සින්දු වන්නම්වලට අදාළ තොරතුරු වේ.
(4) පහතරට සින්දු වන්නම් හා සබරගමු වන්නම්වලට අදාළ තොරතුරු වේ.

26. 'A' කොටසේ තොරතුරු යටතේ තිත් රූප දෙකකට ගැයෙන වන්නමක් නම් කරන්න.
(1) තිසරා (2) ආනන්ද (3) අනිලා (4) කෝකිල

27. 'B' කොටසේ තොරතුරු හා ගැළපෙන සම්ප්‍රදායට අයත් වන්නම් ගණන තෝරන්න.
(1) 12 යි. (2) 18 යි. (3) 24 යි. (4) 32 යි.

28. 'B' කොටසේ තොරතුරු හා ගැළපෙන වන්නම් ගායනයට යොදා ගන්නා අවනද්ධ භාණ්ඩය නම් කරන්න.
(1) ගැට බෙරය (2) පහතරට බෙරය (3) උඩැක්කිය (4) දවුල

29. "තෙදිනි විරාජ රුවිනි විරාජ - රුහුණු සුරාජ කඳ දෙවි රාජ"
මෙම සරල ගීතය නිර්මාණයට පාදක වී ඇති ජන ගී වර්ගය තෝරන්න.
(1) හටන් ගී (2) උඩරට වන්නම් (3) පහතරට වන්නම් (4) ප්‍රශස්ති ගී

WWW.OLEVELAPI.COM

- අංක 30 සිට 33 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා රංග සම්ප්‍රදායන්ට අදාළ පහත සඳහන් ගී පාද කොටස් උපයෝගී කර ගන්න.

**A** - අඹ දඹ නාරං කෙසෙල් දෙල්

**B** - පායාලා අඹරේ

**C** - මං වගෙ ජේඩි කතක් මනා

30. A, B, C යටතේ එන ගීත ඇතුළත් රංග සම්ප්‍රදායන් පිළිවෙලින් නම් කරන්න.
(1) කෝලම්, නාඩගම්, නූර්ති (2) නූර්ති, නාඩගම්, කෝලම්
(3) නාඩගම්, නූර්ති, කෝලම් (4) කෝලම්, නූර්ති, නාඩගම්

31. 'A' හි ඇතුළත් ගීතය ආරම්භ කළ හැකි තාලය තෝරන්න.
(1) බෙම්ටෝ (2) දාදරා (3) කෙහෙර්වා (4) ජප්

32. 'B' හි ඇතුළත් ගීතය ගායනයේ දී වාදනය කරනු ලබන අවනද්ධ භාණ්ඩය නම් කරන්න.
(1) තබ්ලාව (2) පහතරට බෙරය (3) දවුල (4) මද්දලය

[හතරවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**33.** **'C'** හි ඇතුළත් ගීතය ගායනය කරනු ලබන චරිතය තෝරන්න.
(1) මුදලි (2) ආරච්චිල (3) නොංචි අක්කා (4) ලෙන්චිනා

**34.** "සෝබාව දේ මෙපුර" ගීතය ඇතුළත් වනුයේ කිනම් නව නාට්‍යයක ද?
(1) තාරාවෝ ඉගිලෙති (2) කුස පබාවතී (3) රාජ කපුරු (4) මධුර ජවනිකා

**35.** G Major Chord එකට අයත් ස්වර පිළිවෙලින්,
(1) ස ග ප වේ. (2) රි ම් ධ වේ. (3) ප නි රි වේ. (4) ම ධ ස වේ.

**36.** ෂඩ්ජයෙහි කම්පන වාර සංඛ්‍යාතය 256 වන විට පංචමයට හිමි කම්පන වාර සංඛ්‍යාතය වන්නේ,
(1) 288 කි. (2) 320 කි. (3) 340 කි. (4) 384 කි.

**37.** රාගාශ්‍රිතව නිර්මාණය වූ "තූ ගංගා කී මෞජ මෙ" හින්දි ගීතය ඇතුළත් චිත්‍රපටය තෝරන්න.
(1) අභිමාන් (2) බෛජු බව්රා
(3) ජනක් ජනක් පායල් බාජේ (4) මධුමතී

**38.** 'නාද තරංගය' පිළිබඳ කියැවෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) නාද තරංගයක් විෂමාකාරී කම්පනවලින් යුක්ත ය.
(2) නාද තරංගයක් නැවත නැවත ඇසිය නොහැකි වේ.
(3) නාද තරංගයක් සමාකාරී කම්පනවලින් යුක්ත ය.
(4) නාද තරංගයක හඬ අමිහිරි වේ.

**39.** සංගීතය හදාරන ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට ප්‍රයෝජනවත් වන සංගීතමය අංග සහ තොරතුරු විශාල සංඛ්‍යාවක් සහිත අන්තර්ජාල වෙබ් අඩවියකි,
(1) M1D1. (2) E-Learning. (3) YouTube. (4) Encarta.

**40.** ද්‍රවිඩ, හින්දි අනුකරණයෙන් තොර ස්වතන්ත්‍ර තනු ඇතුළත් 'රන්මුතු දූව' චිත්‍රපටය සංගීත අධ්‍යක්ෂණය කරන ලද්දේ,
(1) සෝමදාස ඇල්විටිගල සූරීන් විසින් ය.
(2) පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව සූරීන් විසින් ය.
(3) ආචාර්ය ප්‍රේමසිරි කේමදාස සූරීන් විසින් ය.
(4) සරත් දසනායක සූරීන් විසින් ය.

**

WWW.OLEVELAPI.COM

[පස්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....